ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය
இலங்கை உழைக்கும் ஊடகவியலாளர் சங்கம்
Sri Lanka Working Journalists Association
Incorporated by Parliament Act No.46 in1987/Trade Union Registration No 8528
No.276/3, PRADEEPA MAWATHA, MALIGAWATTE, COLOMBO-10, SRI LANKA | TEL : 0112439276

16-06-2019
කොළඹ

මාධ්‍ය නිවේදනය

**අයි සී සී පී ආර් පනත යටතේ මාධ්‍යවේදීන් අත්අඩංගුවට ගැනීමට තැත් කිරීම**

සිංහල හා ඉංග්‍රීසි භාෂා ද්විත්වයෙන්ම දීර්ඝ කාලයක් තිස්සේ ජනමාධ්‍ය කටයුතු වල යෙදෙන ප්‍රවීණ මාධ්‍යවේදී කුසල් පෙරේරා විසින් ඩේලි මිරර් පුවත්පතට ලියූ **From Islamic Terrorism to marauding sinhala Buddhist violence** (ඉස්ලාමීය ත්‍රස්තවාදයේ සිට කොල්ලකාරී සිංහල බෞද්ධ ප්‍රචණ්ඩත්වය දක්වා) යන ලිපිය පදනම් කරගෙන අයි සී සී පී ආර් පනත හෙවත් 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය යටතේ ශ්‍රී ලංකා පොලීසියේ සංවිධානාත්මක අපරාධ කොට්ඨාශය විසින් ඔහුව අත් අඩංගුවට ගැනීමට දරණ උත්සාහය ශ්‍රී ලංකා ජනමාධ්‍යවේදීන්ගේ සංගමය දැඩිව හෙළා දකිමු.

තවද එම ලිපිය පළවූ පසුගිය 14 වැනි සිකුරාද පොලීසිය විසින් ඩේලි මිරර් පුවත්පතේ ප්‍රධානීන් ගෙන් ප්‍රකාශ සටහන් කරගැනීමට උත්සාහ කිරීම එම පුවත් පතට කරන ලද නිල නොලත් තර්ජනයක් ලෙසද අපට හැඟී යයි.

පසුගිය දිනවල දිවයිනේ බොහෝ පලාත් වල සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා වලට සෘජුවම සම්බන්ධ වූ පූජ්‍ය පක්ෂයට හා පුද්ගලයින්ට මෙන්ම මාධ්‍යවේදීන්ට හා මාධ්‍ය ආයතන වලට අසත්‍ය තොරතුරු සැපයූ (කුරුණෑගල රෝහලේ සිදුවීම වැනි) උසස් පොලිස් නිලධාරීන්ට එරෙහිව ශ්‍රී ලංකා පොලීසිය මෙම අයි.සී.සී.පී.ආර්.පනත යටතේ කිසිදු අධිකරණයකට කරුණු ඉදිරිපත් නොකර, සාධාරණව හා අපක්ෂපාතීව මාධ්‍යකරණයේ යෙදෙන මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතනවලට පමණක් මෙම පනත යටතේ අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමට තැත් කිරීම අප හට මහත් ගැටළුවකි.

මාධ්‍ය නිදහස ස්ථාපිත කරන පොරොන්දුව මත බලයට පත් වූ වර්තමාන ජනාධිපති වරයා ප්‍රමුඛ රජය මේ අයුරින් පොලිසිය ලවා මාධ්‍යය මර්ධනය කිරීමට තැත් කිරීම අප සංගමය දැඩිව හෙළා දකින අතර, මෙවැනි ක්‍රියා නැවත ඇති වීමට ඉඩ නොතබන ලෙසද මාධ්‍යවේදී දඩයම වහාම නවතාදමන ලෙසද අප සංගමය වගකිවයුත්තන් ට අවධාරණය කරමු.

.................................................. ..................................................

දුමින්ද සම්පත් ෆ්‍රෑන්ක් ද සොයිසා
සභාපති ලේකම්

| President | General Secretary | Treasurer | National Organizer |
|---|---|---|---|
| Duminda Sampath | Frank De Zoysa | T. Nadarasa | Nimal Abeysinghe |
| +94 773181731 | +94 715493815 | +94 714967528 | +94 0779868010 |
| dsampath15@gmail.com | frankdezoysa@gmail.com | tnada21@gmail.com | nimalabesinghe589@gmail.com |